## 455 ජයසිරි මඟුලකි

ජය සිරි මඟුලකි අප සැමටා
පිය අප මුනි පා පුදමු තුටා

සුවඳ ජලෙන් නර්බෝනා මිහිර ගලයි සැම දිනේ
වේවා ජය තුති සෙබස්තියන් මුනි
රෝග බියෙන් අප මුදනු මැනේ

වීර අපේ පැරණි දනා ඉඳි කළ මේ දෙව් මැදුරේ
ශාන්ත සෙවනේ වෙමු අපි ප්‍රීති
ජය මඟුලකි අද මේ වසරේ

සුරිඳු නිසා වැගිරි ඔබේ රුධිර ජලේ
මනුලෝ ගැබේ ආත්ම සිරුරේ ඇතිවන විපතේ
මුදනට වරදේ බෙලෙනි ඔබේ

රම්‍ය ඔබේ ග්‍රාම මවේ දරු සැමා ඔබ සෙවනේ
නංවා ජය දද තුති ගී රස විඳ
සැනසෙයි පතමින මුනි සරනේ